# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2022 අංක 20 දරන සිසිර ජයකොඩි සියපත පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 06 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 සැප්තැම්බර් මස 09 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල : රු. 20.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2022 අංක 20 දරන සිසිර ජයකොඩි සියපත පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 06 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 10/2016

## සිසිර ජයකොඩි සියපත පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

''සිසිර ජයකොඩි සියපත පදනම'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඊට අදාළ සියලු කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක 20 දරන සිසිර ජයකොඩි සියපත පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සිසිර ජයකොඩි සියපත පදනම සංස්ථාගත කිරීම

2. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින්මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) දැනට සිසිර ජයකොඩි සියපත පදනමෙහි සාමාජිකයන් වශයෙන් සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''සිසිර ජයකොඩි සියපත පදනම'' යන නාමය හා අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ හා ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

(2) සංස්ථාව, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

3. (1) යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) ස්වයං රැකියාව දිරිගැන්වීම සඳහා විවිධ අධ්‍යයනයන්, දේශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීම සහ ස්වයං රැකියාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රැකියා විරහිතයින් සඳහා අවශ්‍ය පුහුණුවීම්, සහාය සහ අනුග්‍රහය ලබාදීම;

(ආ) අදාළ අධිකාරීන්ගේ එකඟත්වය මත ආගමික ස්ථාන අලුත්වැඩියා කර පවත්වාගෙන යාම සඳහා එම අධිකාරීන්ට සහාය දැක්වීම;

(ඇ) අසරණ ජනතාවට විවිධ සහාය ලබාදීම සඳහා "ජන සහන" යනුවෙන් හැඳින්වෙන ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම;

(ඈ) අවශ්‍ය සුදුසුකම් සහ පුහුණුවීම්වලින් සන්නද්ධ වීම සඳහා උපාධි අපේක්ෂකයින්ට සහාය ලබාදීමට රැකියා වෙළඳපොලේ අවශ්‍යතා මත දේශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීම;

(ඉ) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සහාය ලබාදීම සහ ආධාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම; සහ

(ඊ) අදාළ අධිකාරීන්ගේ එකඟත්වය මත දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, එහි පරමාර්ථ, ජාතිය, කුලය, ආගම, භාෂාව, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙන යම් හේතුවක් මත පදනම් කරගත් වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාව විසින් වග බලා ගත යුතු ය.

රජයේ හෝ පළාත් සභාවේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සහ සංස්ථාවේ පරමාර්ථ අතර ගැටුම් ඇති නොවන බවට සංස්ථාව සහතික විය යුතු බව

**4.** රජයේ හෝ යම් පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්ය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සහ අදාළ ලිඛිත නීති යටතේ අවශ්‍ය අනුමතයන්ට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) මේ පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතීන්ට යටත්ව, සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ධුර දරන සාමාජිකයින් විසින්, (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතීන්ට යටත්ව, (ඈ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මඟින් දක්වා ඇති ආකාරයට සංස්ථාවේ පළමු මණ්ඩලය පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ දින තෙක්, සංස්ථාවේ අතුරු මණ්ඩලයක් වශයෙන් කටයුතු කළ යුතු ය.

(ආ) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි සංස්ථාවේ අතුරු පරිපාලනය සඳහා රීති සෑදීමට සංස්ථාවේ අතුරු මණ්ඩලයට බලය ඇත්තේ ය.

(ඇ) යම් රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරයක් විසින් අතුරු මණ්ඩලයේ යම් තීරණයක් ගනු ලැබිය යුතු ය.

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට අවුරුද්දක කාලයක් ඇතුළත සංස්ථාවේ පළමු මණ්ඩලය පත් කරනු ලැබීම හෝ තෝරා පත් කරනු ලැබීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ද ඇතුළුව මණ්ඩලයේ සෑම ධුර දරන්නකුම අවුරුදු තුනක කාලයක් සඳහා පත්කර ගත යුතු හෝ තෝරා පත්කර ගත යුතු අතර, එම අවුරුදු තුනක කාලසීමාව

ඉකුත් වීමෙන් පසුව එම ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත්කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) යම් ධුර දරන්නකු මියයාම, ඉල්ලා අස්වීම, යම් අශක්නුතාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, මණ්ඩලය විසින් සංස්ථාවේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගැනීම හෝ පත්කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ බලතල

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කුමන හෝ යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කිරීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා සහ කාරණා කිරීමේ, ඉටු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය:-

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, කුලියට ගැනීම, ඉදි කිරීම, අළුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයෙන් ලබා ගැනීම සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) සංස්ථාව විසින් සෘජුවම හෝ යම් නිලධරයකු හරහා හෝ ඒ වෙනුවට බලය ලබාදුන් යම් අනුයෝජිතයකු විසින් හෝ සංස්ථාවේ පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි සියලුම කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට එළඹීම සහ ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) ඇප සහිතව හෝ රහිතව අරමුදල් ණයට ගැනීම හෝ රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් දේශීය හෝ විදේශීය මූලාශ්‍රයන්ගෙන් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාව විසින් ලබාගනු ලබන හෝ සංස්ථාවට දෙනු ලබන සියලුම විදේශීය අරමුදල්, ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලය විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට සහ නිකුත් කිරීමට සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාවේ කාර්යය සඳහා වහා අවශ්‍ය නොවන යම් අරමුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යනුකූල භාරයක් හෝ යම් වාස්තව දේපළක් හෝ පෞද්ගලික දේපළක් භාරගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ පරිපාලනය කිරීම;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ අනෙකුත් සේවා නියුක්තයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම, හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වැටුප් සහ දීමනා ගෙවීම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති අනෙකුත් දේශීය සහ විදේශීය ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(ඒ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී නිලධරයන් සහ අනෙකුත් සේවා නියුක්තයන් පුහුණු කිරීම; සහ

(ඔ) සංස්ථාවේ පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා මේ පනත මගින් බලය ලබා දෙන සියලු දේ කිරීම.

සංස්ථාවේ රීති

7. (1) සංස්ථාව විසින්, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති පහත දැක්වෙන කාරණා සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ යඃ-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන් සහ අනෙකුත් සේවා නියුක්තයන් පත් කිරීමේ නියම හා කොන්දේසි, ඔවුන්ගේ බලතල, කර්තව්‍ය හා කාර්ය;

(ඈ) සංස්ථාවේ සහ මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) මණ්ඩලයේ සහ සංස්ථාවේ සාමාජිකයකු වීම සඳහා සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපළ, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(උ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති අනෙකුත් දේශීය සහ විදේශීය ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාමේ සහ සම්බන්ධීකරණය කිරීමේ කාර්ය පටිපාටිය සහ ආකාරය; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම

රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීති, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එහි සඳහන් දින සිට ඒවා ක්‍රියාත්මක විය යුතු ය.

(4) සංස්ථාව විසින් සාදන ලද සෑම රීතියක් ම, එම රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් රීතියක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන යම් රීතියක්, එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(6) සංස්ථාවේ සාමාජිකයන් සෑම විටක දී ම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**8.** සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් සහ අනෙකුත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරන ලද සාමාජිකයන්ගේ නාම ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය. (සාමාජික නාම ලේඛනය)

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. (සංස්ථාවේ අරමුදල)

(2) 6 (ඇ) වගන්තියේ විධිවිධානවලට යටත්ව, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දයක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ ගිණුමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර, විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කර සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, සාමාජිකයන්ගෙන් යුත් එවැනි ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**11.** (1) මණ්ඩලය විසින්, සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් එක් එක් මුදල් වර්ෂය සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සහ 10 වන වගන්තියේ සඳහන් විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත්කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද සංස්ථාවේ සියලු වත්කම් හා බැරකම් පිළිබඳ ලැයිස්තුවක් ද සමඟ, අදාළ වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර අධ්‍යාපන විෂයය භාර

අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී, සංස්ථාව වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක් සහ සංස්ථාව විසින් එළඹෙන ලද සියලු කොන්ත්‍රාත්වල සහ ගිවිසුම්වල විස්තර සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට අමුණනු ලැබිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ පදනමට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දයක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව

**13.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට, නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළකර ගැනීම

**14.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාවේ මුදල් හා දේපළ, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කිසිදු කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ මුදල්, ප්‍රසාද දීමනා, ලාභ වශයෙන් හෝ කෙසේ හෝ අන්‍යාකාරයෙන් ඍජුව හෝ වක්‍රාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව

**15.** (1) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකුගේ ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව, කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි මණ්ඩලයේ යම් ධුර දරන්නකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ

**16.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුවම, සංස්ථාවේ සාමාජිකයන් විසින් සභාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

18. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.